**සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම - 2016/2017**

-----------------------------------------------------------

සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ ("සමාගම") 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙම විගණනයේදී, මා විසින් ප්‍රසිද්ධ වෘත්තියේ නියැලුණු වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ලබාගන්නා ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

අත්හැර දමන ලද සාම්පූර් ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියට අදාළව ප්‍රාග්ධන නොනිම් වැඩ සඳහා වූ රු.328,109,272 ක මුදලක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති දේපළ, පිරියත හා උපකරණවල ඇතුළත් විය. සිදුවිය හැකි හානිකරණ තක්සේරු කිරීම් සඳහා විස්තරාත්මක හානිකරණ තක්සේරුවක් 2017 මාර්තු 31 දිනට කළමනාකාරීත්වය විසින් සිදු කර නොතිබුණි. මෙම ශේෂය හානිකරණය කර තිබුණේ නම්, සමාගමේ ශුද්ධ ලාභ හා ශුද්ධ වත්කම්, තක්සේරුගත හානිකරණ මුදලින් අඩුකර ගත හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2017 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**කරුණ අවධාරණය කිරීම**

---

ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුලදී සමාගම විසින් සාම්පූර් ගල් අඟුරු බලාගාරයේ සංවර්ධන කටයුතු නතර කළ බව සඳහන් වන මූල්‍ය ප්‍රකාශන සටහන් 4 කෙරෙහි අවධානය යොමු කරවමි. සටහන් 4 හි සඳහන් පරිදි මෙම කරුණ සහ වෙනත් කරුණු මඟින් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් මතු කරවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පවතින බව දැක්වේ. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය නොකෙරේ.

**2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.22,008,999 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 10,590,592 ක් වූ බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.32,599,591 කින් පිරිහී

තිබුණි. ශක්‍යතා අධ්‍යයනවලට අදාළව මූලික ව්‍යාපෘති වියදම් රු.30,574,226 කින් වැඩිවීම මුල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික ජාලයට විදුලිබලය උත්පාදනය කිරීම සහ අලෙවි කිරීම සමාගමේ මූලික කාර්යය වේ. ඒ අනුව, සමාගම විසින් පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයන සිදු කර තිබුණු අතර පාරිසරික බලපෑම් ඇගයීම් නිෂ්කාෂණය (EIA Clearance) 2016 පෙබරවාරි මාසයේදී ලබාගෙන තිබුණි. කෙසේ වුවද, බලාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආරම්භ කර නොතිබුණි.

2017 අප්‍රේල් 26 දින ශ්‍රී ලංකා රජය හා ඉන්දියාව අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව, අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් ඇතුළත්ව 500MW LNG Fired Plant ව්‍යාපෘතිය සමාගම විසින් භාරගත යුතුය.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

### 5.1 වාර්ෂික වාර්තාව

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.